භක්ති ප්‍රබෝධනය
පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

සියවසක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2021 ඔක්තෝබර් 122 වන කාණ්ඩය - 03 කලාපය පිටු 21 QD/81/පුවත්/2021

## බලයට ධනයට ඇතිවන වියරුව




ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල සඟරාව

ආරම්භය 1899

# පහසුවටත් වාසියටත්....

පද රචනය - චන්ද්‍රා දේවාදිත්‍ය
තනු නිර්මාණය - සුනිල් පෙරේරා
ගායනය - සුනිල් පෙරේරා ප්‍රමුඛ ජිප්සීස්







පහසුවටත් වාසියටත්
දැන දැන වැරදි කරනවා
එහෙම කළත් නිදහසටත්
කියන්න කරුණු තියෙනවා
නැතිනං හදල කියනවා //

ගමරාළාගෙ එළ හරකෙක්
හොරකම් කළ හරක් හොරෙක්
දුටු ගමයා කෑ ගැසුවා
'ඈ... කවුද කවුද කවුද මිනිහෝ
මගෙ හරක අරං යන්නෙ?'
'ඔහේගෙනං ඔහේ ගන්න
හොඳ නෑ නොවැ දොස් කියන්න'
'අනෙ මගෙ කට'
'හරකෙක් කොහෙද මා ළඟ
කඹයනෙ අල්ලං ඉන්නේ'

කිතුලක රා බොන්න හිතී
මිනිහෙක් කිතුලකට නැගී
අයිතිකරුට අසුවූවා
'ඕයි... කවුද ඩෝ
ගස් බඩගාන්නෙ පාන්දර ජාමේ'
'තණකොල ඩිංගක් කපන්න
හිතුණා ගහ උඩට යන්න'
'තණකොල? ගහ මුදුණෙ?' 'ඒක තමයි...
තණකොල නෑ ගහ මුදුණේ
අනේ ඒකයි බිමට බහින්නේ,

මරණව මම තඩි බළලා
වෙරි වූ මීයෙක් කියලා
බළලා හට මෙය ඇහිලා
'ඈ... මාව මරන්න තෝ?'
'කාපු බීපු වේලාවට
පුංචි විහිළුවක් කෙරුවට'
'විහිළු? හොඳ විහිළු'
'රාළහාමිලා වගේ අය
ගණන්ගන්නෙ ඇයිද සුළු දෙය'

නැතිනං මවල කියනවා // නැතිනං පැනල දුවනවා //
සමහරු ගහල දුවනවා //නැතිනං හදල කියනවා //ඇත්ත නැත්ත කරනවා//



මෑතකදී අප අතරින් සමුගත් සුනිල් පෙරේරා මහතාණන් ඇතුළු 'ජිප්සීස්' සංගීත කණ්ඩායම දශක පහකට අධික කාලයක් පුරා ලාංකේය සංගීත ක්ෂේත්‍රයට දායාද කළ විශේෂ නිර්මාණ රැසකි. ඔහු ඇතුළු කණ්ඩායම ගායනා කළ බොහෝ ගීතවලින් ඔවුහු සමාජයේ විවිධ පාර්ශ්වයන්හි වැරදි අභියෝගයට ලක් කළහ. ඒ අතරින් "පහසුවටත් වාසියටත්" ගීතයට හිමි වන්නේ ප්‍රමුඛ ස්ථානයකි.

කෙනකු වැරද්දක් කිරීමෙන් පමණක් නොනැවතී එය නිර්ලජ්ජිතව සාධාරණීකරණය කරන අයුරු උපහාසාත්මකව ගෙන හැර දැක්වීම මේ ගීතයේ වස්තු බීජයයි. තමන් අතින් වරදක් සිදු වුණි නම්, පසුතැවිලි වූ සිතින් යුතුව එය පිළිගෙන, වැරැද්ද නිවැරදි කර ගැනීමට යොමුවීම ශ්‍රේෂ්ඨ මනුෂ්‍ය ගුණාංගයකි. එහෙත් අද බොහෝ විට සිදුවන්නේ නිදහසට බොරු කරුණු හුවා දක්වමින්, එසේත් නොමැතිනම් තමන්ට වඩා ධනයෙන්-බලයෙන්-නිලයෙන් පහත් අයෙකුව වරදට හසුකර දෙමින්, තමන් දඬුවමින් බේරීමට උත්සාහ කිරීමයි.

වර්තමාන ශ්‍රී ලාංකේය දේශපාලන සන්දර්භය තුළ ද මෙය නිතැතින්ම දක්නට ලැබෙනවා නොවේද? වංචා, දූෂණ පමණක් නොව මිනීමැරුම්ද සිදුකළ පසු ඉතා පහසුවෙන් නීතියේ රැහැනින් පවා බේරී යාමට දේශපාලන සහ ව්‍යාපාරික බලවතුන්ට අද හැකි වී ඇත.

එක් පසකින්, ගීතය අපට ආරාධනා කරන්නේ එවැනි බැටළු හම් පොරවාගත් වෘක ගති ඇත්තන්ව හඳුනා ගැනීමටයි. අනික් පසින්, අනුන් රවටා තමන් වැජඹෙන ව්‍යාජ මිනිසුන් අතර අවංකව සහ ධර්මිෂ්ඨව ජීවත් වන්නට වෙර දැරීමටයි.

එවන් උදාර ජීවිත අරමුණක් කරා ජීවිතය රැගෙන යාමට අප එකිනෙකාට හැකි වේ නම්, එයම නොවේද අප බලාපොරොත්තු වන ධාර්මික සමාජයක ඇරඹුම?

සුනිල් පෙරේරා ගායකයාණනි මේ ගීත විවරණය ඔබට පිදෙන උපහාරයක් වේවා!

ගරු ශානිල් දිනුක ජයවර්ධන (නි.ම.නි.) පියතුමා
රෝමයේ සිට

# භක්ති ප්‍රබෝධනය

2021 ඔක්තෝම්බර්


**ප්‍රකාශනය**

නිර්මල මරිය නිකාය

**භාරකරු**

අතිගරු රොෂාන් සිල්වා නි.ම.නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

**සංස්කාරක**

ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා

**සංස්කරණ සහාය**

රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
ෆිලීෂන් අබයකෝන්

**පරිගණක සැලසුම හා කවර නිර්මාණය**

අචල රූපසිංහ


## පිටුවෙන් පිටුව..........


2 කවරයේ කථාව

3 හෙළිදරව්ව

4 පිරිහීමේ පරිණාමනය හා පරිවර්තනය
- මහාචාර්ය ඇන්ටන් මීමන

6 යුක්තිගරුක සංවර්ධිත රටක්
- දිලුම් යූ. ප්‍රනාන්දු

8 ධනේශ්වරයට විකල්පය බලේශ්වරය ද
- සපුගස්කන්දේ රංජිත්

10 ලැප් - ටොප් - මැටිල්ඩා අදිකාරම්

13 ඕං එහෙනං - ජෝසප් ඩයස්

14 Where there are great riches...
- Rev. Fr. Don Anton Saman Hettiarachchi

17 මේ අහන්න
- සඳමාලි ජයසිංහ

18 ඔබ කැත ද? - වෛද්‍ය සචිත මිලින්ද

19 අමිතගේ හද ගැස්ම - සී. අමිත

20 වැව් තාවුල්ල - රුවිනි කාවින්දයා
ජපමාල මාසය - බෙනඩික්ට් විජේසිංහ


21 චුට්ටා
- ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි.

# භක්ති ප්‍රබෝධනය



වසර 1899 සිට අඛණ්ඩව එළිදක්වන භක්ති ප්‍රබෝධනය ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල සඟරාවයි. භක්ති ප්‍රබෝධනය නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශිකයේ භාරකාරත්වය යටතේ පළවන ප්‍රකාශනයකි. (නි.ම.නි.)

Bhakthi Prabodhanaya, Published continuously since 1899, is the oldest Sinhala magazine in Sri Lanka. Bhakthi Prabodhanaya, is owned and published by the Colombo Province of the Oblates of Mary Immaculate. (O.M.I.)


## කවරයේ කථාව

බලය සහ ධනය යහපතට හෝ අයහපතට භාවිත කළ හැකි ය. බලයට ධනයට ඇති වියරුව අති භයංකරය. තමන් පමණක් නොව අනුන්වද විනාශ කරමින් මෙලොවට පමණක් නොව එලොවටද තමන් පුස්සක් සහ සාපයක් වන බව තේරුම් ගැනීමට පවා ඔවුන් අන්ධය. ශ්‍රී ලංකාවේද සැලකිය යුතු පිරිසක් බලයට සහ ධනයට වියරු වැටී එකෙක් පරයා අනිකා ඉහළට ඒමට දඟලන තරඟයේදී ගහ මරා ගනිමින් දිළිඳුන්ව තාඩනයට පීඩනයට ලක් කරමින්, සුබ විහරණයෙන් මං මුළා වූ ජීවිත ගමනක නියැලෙති. එවන් අධර්මිෂ්ඨ මනුෂ්‍ය ජීවිත ගමනක අවසානය සමාන කළ හැක්කේ ප්‍රපාතයකට ඇද වැටීමෙන් සිදුවන විනාශයට බව මෙවර කවරයේ කථාව පසක් කර දෙයි.

ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා


**භක්ති ප්‍රබෝධනය**

දායකත්වය එක් වසරකට - රු. 500.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

දායකත්වය සය මසකට - රු. 250.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලුම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපෑල :
bhakthi.prabodhanaya@gmail.com

**BHAKTHI PRABODHANAYA**

Local Subscription Rate.

Rs. 500.00 per year (Including Postage)
Rs. 250.00 per six months
(Including Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com

හෙළිදරව්ව

# බලයට ධනයට ඇතිවන වියරුව

මිනිසා ස්වභාවයෙන්ම බලයට කෑදරකමක් පෙන්වයි. ඒ නිසා බලය ලබා ගන්නට බලකාමීහු බොරු කියති. අනුන්ව නොමග යවති. අල්ලස් ලෙස විවිධ දීමනා දෙති. කුට වැඩසටහන් ක්‍රියාත්මක කරති. සැබෑ ආධ්‍යාත්මිකත්වයෙන් තොරව බලය ලබන ඔවුහු බලයෙන් මත් වෙති. ඒ බලය පවත්වා ගෙන යාමට යහපතට වඩා අයහපත් දේ කරති. මිනිසුන්ව මර්දනය කරති. හිරිහැර කරති. විනාශ කරති. එපමණක් නොව බලය රඳවා ගන්නට අශීලාචාර, අධර්මිෂ්ඨ, අමානුෂ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරති. නීතියද තමන්ගේ වාසියට නමන්නට ඔවුන් සමත් වී ඇත. ඈත අතීතයේ පටන් අද දක්වා එවන් අනිසි බලයට එරෙහිව නැඟී සිටි මිනිසුන් ලක්ෂ ගණනින් ජීවිත පූජා කර ඇති බව ඉතිහාසය පෙන්වා දෙයි. වර්ෂ 1889 අප්‍රියෙල් 20 දා ඔස්ට්‍රියාවේ "බ්‍රව්නාව් ඇම් ඉන්" (Braunau am Inn) නගරයේ මෙලොව එළිය දුටු ඇඩොල්ෆ් හිට්ලර් මුළු ලොවම භීෂණයෙන් මුසපත් කළ ඒකාධිපති චරිතයකි. බලයට ඇති වියරුවට හෙතෙම කදිම නිදසුනකි.

මිනිසකුට බලය ලැබුණ විට ඔහුගේ නියම චරිතය දැක ගත හැකිවනු ඇත යන්න ඇමරිකාවේ පහළ වූ දහසය වන ජනාධිපති ඒබ්‍රහම් ලින්කන් පැවසුවේ ය. එය අතීතයට පමණක් සීමා නොවන වර්තමානයට සහ අනාගතයට වලංගු සත්‍යයකි.

එමෙන්ම බලයට සාපේක්ෂව ධනයද අයිති කර ගන්නට දරන උත්සාහයේදී අයුතු ලෙස ධනය රැස් කරන්නට ඔවුහු උත්සාහ කරති. මිනිසුන්ගේ මළකඳන් උඩින් පවා බලය පවත්වා ගන්නට ධනය රැස් කරන එවන් දුදනෝ සමාජයේ හතු පිපෙන සේ අද ද දැක ගත හැකි ය.

නිදොස් හෘදය සාක්ෂියක් ඇතිව නිර්ව්‍යාජව සමාජය ගැන තත්ත්ව පරීක්ෂණයක් කළහොත් අපට දැනෙන්නේ කුමක්ද? ධාර්මික සියලු දේ අප්‍රාණික කර විනාශයට ඇද දමමින් අධාර්මික සියලු දේ හිස ඔසවන්නට බලවතුන් ගන්නා උත්සාහය කෙතරම් භයානකද යන්නය. නා නා ප්‍රකාර "සුරතලුන්" දමාගෙන වෛරය, ක්‍රෝධය පලිගැනීම වපුරන්නට ආගම, ජාතිය, පක්ෂය, භාෂාව යොදාගැනීම කෙතරම් නින්දිතද යන්න ය.

යුක්තිය, සාධාරණත්වය අතුරුදහන් කර, සත්‍යය නිහඬකර වංචාව දූෂණය ඔටුනු පැළඳවීමට ඔවුන් දරන වෑයම දිය යටින් ගින්දර ගෙනියනවා තරම් සටකපට ය. දහම් හර, දහම් ඉගැන්වීම් නොසලකා ලෙහෙසි පහසු බාහිර වත්පිළිවෙත්වලට ආගම සීමා කරන ඔවුන්ගේ ක්‍රමවේදය යහපත් වටිනාකම්වලින් හෙබි උසස් නැණවත්, ගුණවත්, පුරවැසියන් අනාගතයේදී බිහිවීම "ගබ්සාකිරීමක්" නොවන්නේද?

මෙවන් වාතාවරණයක තම දහම් වටිනාකම් සහ එහි ඇති වැදගත්කම සිතන ඊට පිපාසිත සියලු සැදැහැවත් ජනතාවගේ වගකීම සහ යුතුකම කුමක්ද? අපගේ පරිශුද්ධ දහම් ඉගැන්වීම් තුළ රැඳෙමින් ධර්මයෙන් අධර්මය පරාජය කළ හැකි බවට විශ්වාසයක්, බලාපොරොත්තුවක් අප තුළ ඇති කර ගැනීමයි. අසත්‍යයට, ප්‍රෝඩාවට, මුසාවට ඇති ආයුෂ ඉතා කෙටි බව අවබෝධකර ගැනීමයි.

දෙවියන්වහන්සේ අදහන කිතුනු ජනතාවක් ලෙස අප සිට ගත යුත්තේ කුමන කඳවුරක් තුළද? පළමුවෙන් නපුරාගේ බලවේග විවිධ මනුෂ්‍යයන් හරහා අපව වෙළා ගත හැකි බව වටහා ගත යුතු ය. අනතුරුව ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ පාපයේ අන්ධකාරය නැතිකර මරණය පරාජය කොට ජීවිතයට නව ආලෝකයක් උදා කරමින් ජීවිතය විජයග්‍රහණය කළ පරම සත්‍යයේ විමුක්තිදායකයාණෝ යන්න අප පිළිගත යුතුය.

ඒබ්‍රහම් ලින්කන්, නෙල්සන් මැන්ඩෙලා,

මහත්මා ගාන්ධි, ශුද්ධ වූ තෙරේසා මව්තුමිය වැනි ලෝක පූජිත චරිත තම තමන් ගොඩනගාගත් ආධ්‍යාත්මික ජීවිතයේ බලය හරහා තමන් කුමන ආකාරයක නායකත්වයක සිටියත් මුළු ලෝකයටම ලබා දුන් ආදර්ශය සුළු පටු නොවේ.

"බලය භාවිත කළ යුත්තේ අවංක සේවයක් සඳහාය" යන්න ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පාප්වහන්සේ පවසති. බලයට වියරු වැටී බලය අපයෝජනය කරන බොහෝ අයට මෙය කදිම පූර්වාදර්ශයකි. අද යුගයේ වගකීම සහ යුතුකම ඉෂ්ට කරන්නට එවන් ශ්‍රේෂ්ඨ චරිත අපට පිටිවහලකි. පහන් ටැඹකි.

බලයට ධනයට වියරු වැටී අධර්මිෂ්ඨව, සිය නපුරු ආත්මාර්ථකාමී අපේක්ෂාවන් ඉෂ්ට කර ගන්නට වෙර දරන බලකාමීන්ගේ කුට උපායවලට නොරැවටෙමු. "Divide and Rule" "භේදභින්න දියත් කරමින් පාලනය" පවත්වාගෙන යන්නට ඔවුන් දරන සියලු ක්‍රියාවලින් ප්‍රඥාගෝචරව තේරුම් ගෙන ඒ උගුලට හසු නොවීමට සැදැහැවත් ජනතාව වග බලා ගත යුතු ය. ඒ දූදනන්ගේ, දහම් හරවලට නොගැළපෙන ක්‍රියා පරිපාටි පරාජය කරනු වස් දහම් හර ජීවත් කරන්නට පෙළ ගැසෙමු. එවිට මිනිසුන් පෙළන බොහෝ වහල්කම්වලින් ඒ අය මුදා ගතහොත් අනාගත පරපුරට නිවහල් ජීවිතයක් ගත කරන්නට හැකි සමාජයක් උදාකරවාලන්නට දේව ආශීර්වාදය ද අප සැමට ලැබෙනු ඇත.

**සංස්කාරක සටහන**

# පිරිහීමේ පරිණාමනය හා පරිවර්තනය

මානව සමාජයේ පිරිහීම ආරම්භ වන්නේ මිනිස් හදවතේ, මනුෂ්‍ය අභ්‍යන්තරයේ පිරිහීම තුළින් ය. පිරිහීමට ලක්වූ පුද්ගලයන්ගේ ක්‍රියාකාරකම්, අදහස් හා සිතුම් පැතුම් කාලාන්තරයක් තිස්සේ සමාජ ගත වූ විට, එය සංස්කෘතියේ කොටසක් බවට පත්වේ. එය සංස්කෘතියේ කොටසක් බවට පත් වූ විට, එය එක පරපුරකින් තවත් පරපුරකට ගලාගෙන යයි.

යම් ප්‍රවණතාවක් සංස්කෘතියේ කොටසක් බවට පත් වූ විට, ඒ දෙස විචාරශීලී ලෙස බලන ප්‍රමාණය අඩුවේ. ඊට හේතුව නම්, එය සාමාන්‍යකරණයට හා සාධාරණීකරණයකට ලක් වීමයි. තනි පුද්ගලයන්ගේ පිරිහීම අධික වන තරමටම සමස්ත ජන සමාජයේම පිරිහීම අධික වීමට පටන් ගනී . එසේ පිරිහීමට ලක්වූ පුද්ගලයන් සමාජ, ආර්ථික, අධ්‍යාපනික, දේශපාලනික, මාධ්‍ය, සංස්කෘතික හා ආගමික ක්ෂේත්‍රවල ඉහළ වගකීම් දරන පුද්ගලයන් බවට පත් වූ විට, ඔවුන් සෘණාත්මක ලෙස අනිකුත් පුද්ගලයන්ගේ ජීවිතවලට කරන බලපෑම ද ප්‍රබල වේ.

පිරිහීම සංස්කෘතියේ කොටසක් බවට පත් වූ විට, මිනිසුන්ගේ සවිඥානිකත්වය නිර්වින්දනයට භාජනය වේ. එනම් සමාජයේ පිරිහීම ගැන මිනිසුන් අවදියෙන් සිටින ප්‍රමාණය, අවබෝධයෙන් සිටින ප්‍රමාණය අඩු වේ. මෙය අතිශයින්ම භයානක තත්ත්වයකි. මෙවැනි තත්ත්වයක් යටතේ මිනිසුන් දුක් විඳින ප්‍රමාණය වැඩි වේ.

පැරණි ගිවිසුමේ එන මහා දිවැසිවරයන් බිහි වන්නේ එවැනි පිරිහීමට ලක් වූ පසුබිමක් තුළ ය. දූෂිත වූ පැරණි ඊශ්‍රායෙල් සමාජයේ සැබෑ තත්ත්වය ඉතා නිර්භීතව සහ අවංකව හෙළිකිරීමත්, ඒ තත්ත්වයට විසඳුමක් ලෙස ජනතාව බලවත් කිරීමත් දිවැසිවරුන් අතින් සිදු වූ ප්‍රධාන කාර්යභාර දෙකකි.

වර්තමානය පවා පිරිහීමට ලක් නොවූ, දූෂණයට ලක් නොවූ පුද්ගලයන්ගේ ආදර්ශය නොමැතිව ලාංකික සමාජය වෙනස් කළ නොහැකිය. දූෂණයට එරෙහිව කථා කිරීමෙන් හෝ දේශනා කිරීමෙන් හෝ පමණක් ජන සමාජයක් ප්‍රතිසංස්කරණය කළ නොහැකිය. ඒ සඳහා දැහැමිව, සර්ව සාධාරණව, නිහතමානව, ශුද්ධවන්තව, තම ආත්මය පාවා නොදී, හෘදයසාක්ෂියට එකඟව ජීවත් වන පිරිස අවශ්‍යය. ඒ පිරිස ඉතා සුළුතරයක් විය හැකිය.

මානව ඉතිහාසයේ සැම කාලයකදීම අව්‍යාජ වෙනසක්, සැබෑ පරිවර්තනයක් උදෙසා කටයුතු කර

ඇත්තේ, ඒ සඳහා කැපවුණු සුළු පිරිසක්ය. ජේසුස් වහන්සේ තම දූත මෙහෙවර පටන් ගත්තේ පුද්ගලයන් හතර දෙනකුගෙන්ය. (පේදුරු, ඇන්ඩෘ, ජාකොබ් සහ ජොහන්). ඔවුන්ගෙන් උන්වහන්සේ ඉල්ලා සිටියේ උන්වහන්සේ මෙන් ජීවත් වෙන ලෙසය. උන්වහන්සේගේ ජීවිත රටාව අනුගමනය කරන ලෙසය. එමෙන්ම උන්වහන්සේ තම අනුගාමිකයන්ගේ ඉල්ලා සිටියේ මේ ක්‍රියාවලියට තවතවත් පුද්ගලයන් බඳවා ගැනීමට ය. ඔවුන්ටත් උන්වහන්සේව අනුගමනය කරන්නට ආරාධනා කරන ලෙසට ය.

මානවයා තුළ අනිකුත් පුද්ගලයන්ගේ ජීවන රටාව අනුකරණය කිරීමට ස්වභාවයෙන්ම ප්‍රවණතාවක් පවතී. විශේෂයෙන් තරුණයන් තුළ මේ ප්‍රවණතාව ඉතා ප්‍රබලය. පුද්ගලයකුගේ චරිතයේ ගුණාත්මකභාවය ගැන එතරම් තැකීමක් නොමැතිව, තරුණ පරපුර විසින් ප්‍රසිද්ධ පුද්ගලයන් ව අනුකරණය කිරීමට පෙළඹේ. ඉතා දූෂිත දේශපාලනඥයන්ව වීරයන් වශයෙන්, රටේ ගැළවුම්කාරයන් වශයෙන්, සැබෑ දේශප්‍රේමීන් වශයෙන් සලකා කටයුතු කිරීමද මේ මානසිකත්වයේම කොටසකි.

තරුණ පරපුර විසින් දූෂිත පුද්ගලයන්ව අනුකරණය කිරීම නිසාත්, සමාජයේ පිරිහීම තව තවත් තීව්‍ර වේ. වර්තමාන ලංකාව තුළ තරුණ පරපුරට අනුකරණය කිරීමට සිටින පරමාදර්ශී චරිත ඉතා විරලය. දූෂිත පුද්ගලයන්, සැම ක්ෂේත්‍රයකම ඉහළ ම වගකීම් දරන පුද්ගලයන් බවට පත් වූ විට, ඔවුන් බිහි කරන්නේ හා පෝෂණය කරන්නේ තවත් දූෂිත පරපුරක් ය.

ලංකාවේ දූෂිත පුද්ගලයන්ගේ සංඛ්‍යාව දෛනිකව වැඩි වෙන්නේ මේ හේතුව නිසාය. එවිට ලාංකික සංස්කෘතියේ මූලික ලක්ෂණ බවට පත් වන්නේ දූෂණය, වංචාව, බොරුව, රැවටීම, අයුක්තිය, අසාධාරණය, තර්ජනය, හිංසාව, හොරකම, මැරකම යන ආදියයි. ඒ ප්‍රවාහය නවතා දැමීමට නම් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතයේ වටිනාකම් අනුව ජීවත් වන පිරිස් සාමූහිකව කටයුතු කර එකිනෙකාව ධෛර්යයට පත් කළ යුතු වේ. එය හුදකලාව කළ නොහැකි ය.

ඒ සාමූහික ප්‍රයත්නයන් තුළින් නව සංස්කෘතිකත්වයකට අඩිතාලම දැමිය හැකිය. එවිට තරුණ පරපුර එවැනි ධර්මිෂ්ඨ පුද්ගලයන්ව පරමාදර්ශී චරිත හැටියට අනුකරණය කිරීමට පටන් ගනී. දූෂණය පරාජය කළ හැක්කේ දූෂිත නොවූ පුද්ගලයන්ට පමණි. සමාජයේ පිරිහීමට දායක නොවී සිටීමට ගැඹුරු ආධ්‍යාත්මික දැක්මකට අනුව ජීවත් විය යුතු වේ. ඒ සඳහා අපට අනුගමනය කළ හැකි ශ්‍රේෂ්ඨතම පරමාදර්ශය නම් ජේසුස් වහන්සේ ය.

**මහාචාර්ය ඇන්ටන් මීමන**

## "භක්ති ප්‍රබෝධනය" සඟරාව ඩිජිටල් තාක්ෂණය ඔස්සේ...

වර්ශ 1899 ආරම්භ වූ ඉපැරණිම සිංහල කතෝලික සඟරාව වන "භක්ති ප්‍රබෝධනය" මුද්‍රිත සඟරාවක් ලෙස පසුගිය මැයි මාසයෙන් පසු මුද්‍රණය කර බෙදා හැරීමට අපට හැකියාවක් නොලැබුණි. එසේ වූයේ කොරෝනා වසංගතය නිසා අපගේ දෙව්මැදුරුවල සිදු කරන දිව්‍ය පූජාව ඇතුළු දේව මෙහෙයන්වලට බැතිමතුන්ට සහභාගී වීමට ඇති අවස්ථාව අහිමිවීම නිසාය. ඒ නිසා මේ සඟරාව මුද්‍රණය කර ඔබ අතට යළි පත් කරන තුරු විකල්ප ක්‍රමවේදයකින් "ඊ-සඟරාවක්" ලෙස ඉදිරිපත් කරමු. මේ සඟරාව කියවා බලා මෙහි ඵලදායීතාව සඳහා ඔබට යමක් යෝජනා කරන්නට හෝ අදහසක් බෙදා ගැනීමට කැමතිනම් ඔක්තෝබර් 31 දාට පෙර අප වෙත එවන්න (email address - bhakthi.prabodanaya@gmail.com).

"භක්ති ප්‍රබෝධනය" සඟරාව මෙවර මතුකරන සඟරාවේ තිබෙන පණිවුඩය ඔබටද දැනෙන්නේ නම් මේ සඟරාව හැකි තරම් බෙදාගන්න. රටක පුරවැසියන්ට නිවැරදි අවබෝධය ලබා දීම ආගමික යුතුකමක් පමණක් නොව සමාජ සත්කාරයකි.

# යුක්තිගරුක සංවර්ධිත රටක් . . . . .



"හිටපු කම්කරු නිලධාරියාට වසර 14 ක සිර දඬුවමක්" (2021-08-06)
"කළමනාකාර සහකරුට රු. 20,000/- ක දඩයක් - මාස හයක සිර දඬුවමක්" (2021-03-04)

මේ අල්ලස් ගැනීමේ වරදට දඬුවමට යටත් කරනු ලැබූ වරදකරුවන් දෙදෙනකු සම්බන්ධයෙන් පළවූ පුවත් සිරස්තල දෙකකි. අල්ලස් ගැනීම මෙන්ම අල්ලස් දීම ද, අපරාධමය වරදක් ලෙස අපගේ නීතියේ හඳුනාගෙන ඇත. අල්ලස හා බැඳී ඇති අනික් වරද නම් දූෂණයයි.

ශ්‍රී ලංකාවේ අල්ලස හා දූෂණයට එරෙහිව ක්‍රියාකිරීමට පිහිටුවා ඇති අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මේ වසරේ එළඹී වැදගත් නමුත් ජනමාධ්‍ය තුළ වැඩි කතාබහට ලක්නොවූ ප්‍රතිපත්තිමය තීරණයක් වූයේ දැනට එම කොමිෂන් සභාව පවරා ඇති නඩු 45 ක ප්‍රමාණයක් තාක්ෂණික දෝෂයක් මත ඉල්ලා අස්කරගැනීමට තීරණය කිරීමයි. උදාහරණයක් ලෙස හිටපු අගවිනිසුරු මොහාන් පීරිස් මහත්මාට එරෙහිව පැවති අල්ලස් හෝ දූෂණ චෝදනා එලෙස 2021-03-16 දින ඉල්ලා අස්කරගැනීම දැක්විය හැකිය.

රාජ්‍යය තුළ අල්ලස සහ දූෂණය තුරන් කිරීම හෝ අවම කිරීම සඳහා ගන්නාවූ පියවර කෙරෙහි අවධානයෙන් බලා සිටින පිළිගත් ජාත්‍යන්තර සංවිධාන විසින් 2020 වසරේ දී අප ශ්‍රී ලංකාව තබා ඇත්තේ ලොව රටවල් 180 ක් අතුරින් 94 වන ස්ථානයේය. 2021-01-28 වන දින Transparency International ආයතනය විසින් නිකුත් කළ මේ දූෂණ සංජානන දර්ශකයේ (Corruption Perception Index - CPI) බොහෝ සංවර්ධිත රටවල් සතුටුදායක ස්ථානයක පවතින අතර සංවර්ධනය වෙමින් පවතින තුන්වන ලෝකයේ රටවල් පවතින්නේ ඉතා අසතුටුදායක මට්ටමකය.

අල්ලස සහ දූෂණය රටක කශේරුකාවට ප්‍රබලව බලපෑම්කරන පිළිලයක් ලෙස හැඳින්වීම සාවද්‍ය නොවේ. එය හොඳින්ම වටහාගත් ලී ක්වාන්යූ මහත්මා සිංගප්පූරුව ගොඩනැඟීමේ දී පළමුව සිදුකළේ දූෂණය මුලිනුපුටා දැමීමයි. මහතීර් මොහොමඩ් මහත්මාට විශ්‍රාම වයසේ දී නැවතත් බලයට පැමිණීමට සිදුවූයේ ද, දූෂණය පිටුදැකීමටයි. ඒ අනුව රටක සංවර්ධනය, යහ පාලනය, නීතියේ ආධිපත්‍යය, ජන ජීවිතයේ යථා පැවැත්ම සහ අනාගතය තීරණය කිරීමෙහි ලා අල්ලස සහ දූෂණය දුරින් දුරු විය යුතුය.

ශ්‍රී ලංකාවේ අල්ලස සහ දූෂණයට එරෙහිව නීතිය සම්පාදනය වන්නේ 1954 අංක 11 දරන අල්ලස් පනත මඟිනි. වරින් වර සංශෝධනය වූ මේ පණතට 1994 අංක 20 දරන පනත මඟින් දූෂණය නම් වරද හඳුන්වා දී ඇත. එසේම 1994 අංක 19 පනත මඟින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිහිටුවීම ද, වැදගත් පියවරකි.

ඒ අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා

විමර්ශනය සිදුකිරීම, සාක්ෂි සටහන් කිරීම, නඩු පැවරීම, සහ චෝදනා ගොනුකිරීම අල්ලස් හා දූෂණ කොමිෂන් සභාව මගින් සිදුකරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන ආ 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් මේ කොමිෂන් සභාව වඩා ස්වාධීන සහ අපක්ෂපාත ආයතනයක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය නීතිමය පසුබිම සැකසුණ බවද අවිවාදයෙන්ම පිළිගත යුතුය. උදාහරණයක් ලෙස ඒ සංශෝධනය මගින් කොමිෂන් සභාවට කිසිදු පැමිණිල්ලකින් තොරව සිය මෙහෙයවීම මගින්ම විමර්ශනයක් ආරම්භ කිරීමට බලය ලබා දී ඇත. අල්ලස සහ දූෂණය වැළැක්වීමට නම් පළමුව ඒ චෝදනා විමර්ශනය කරන්නා ස්වාධීනව සහ බාහිර බලපෑමකින් තොරව ක්‍රියාකළ හැකි තත්ත්වයක පැවතිය යුතුය. නොඑසේනම් සිදුවනුයේ යුක්තිය අපගමනය වීමකි. එවැනි තත්ත්වයක් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සංශෝධනය මගින් ගෙන ආ ජනාධිපතිවරයාගේ පත්කිරීම්වලට අදාළ බලතල නිරීක්ෂණය කිරීමේදී පෙනීයයි.

පසුගිය කාලවකවානුව තුළ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමට කැඳවූ ඇතැම් දේශපාලනඥයන් විමර්ශනවලට සහාය නොදී ඉන් මගහැරිය ආකාරයත්, ඔවුන්ගේ දූෂිත කල්ක්‍රියාවත් ජනතාවට අමතක වී ඇති බවත් පසුගිය පාර්ලිමේන්තු මහ මැතිවරණයේ ප්‍රතිඵල දෙස බැලීමේදී පෙනී යයි. ඇතැම් දූෂිත අපේක්ෂයන් ජයග්‍රහණයකර තිබුණේ වාර්තාගත මනාපය ලබාගනිමිනි.

1975 අංක 01 දරන වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පණත යටතේ වන අපරාධමය වැරදි විමර්ශනය සඳහා බලය ලබා දී ඇත්තේ ද, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමටය. යම් පුද්ගලයකුගේ ආදායම් හෝ ලැබීම්වලින් කළ හැකි ප්‍රමාණයට වඩා දේපළ රැස්කරන්නේ නම් හෝ වියදම් කරන්නේ නම් නිසැකවම ඒ තැනැත්තාට එරෙහිව නීතිය ක්‍රියාත්මක විය යුතුය. එහෙත් එලෙස නීතිය ක්‍රියාත්මක වූ එකද දේශපාලනඥයකු හෝ ව්‍යාපාරිකයකු පිළිබඳව හෝ අප අසා නැත. අනික් අතට පාලකයින් පොහොසතුන් වී ජනතාව දුප්පතුන් වීමේ රහස ඇත්තේ ද, එතැනයි.

දැන් දැන් මෙම තත්ත්වය වඩා ඉදිරියට ගොස් නීතිය මගින්ම දූෂිත ධනය සහ වත්කම් සඳහා නිත්‍යානුකූලභාවය ලබා දීමට ද අප රටේ නීති සම්පාදක ආයතනය වන පාර්ලිමේන්තුව උත්සුකවී ඇති බව පෙනී යයි. පසුගිය සැප්තැම්බර් මස 15 වන දින සම්මත වූ 2021 අංක 18 දරන මුදල් පණතේ අරමුණ වී ඇත්තේ ද, හෙළිදරව් නොකළ සැපයුම්, ආදායම් සහ වියදම් හෙළිකරන පුද්ගලයින් කෙරෙහි නීතියෙහි ඇති වගකීමෙන් ඔවුන් නිදහස් කොට ඒ වත්කම් නිදහසේ පරිහරණයට ඉඩහසර ලබා දීමයි. මෙය කොතරම් දුරට අපගේ රටේ යුක්තිය, සාධාරණත්වය සහ ජනතා අයිතිවාසිකම් කෙරෙහි අහිතකර විය හැකිද යන්න සිතා බලන්නට තරම් මේ මොහොතේ ජන මනස නිරවුල් නොවීම ද, එක් අතකින් නීති සම්පාදකයාට වාසියකි.

වර්ෂ 2003 දී සම්මත කරගත් දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය වර්ෂ 2004 දී අත්සන් තබා පිළිගත් දකුණු ආසියාවේ පළමු රටද, ලෝකයේ දෙවන රට ද වන ශ්‍රී ලංකාව ඒ සම්මුති කොතරම් දුරට ක්‍රියාවේ යොදවන්නේ ද යන්න බුද්ධිමත් ජනතාව මෙහිදී සිතා බැලිය යුතුය. එක් රටක එක් නීතියක් පිළිබඳ කෑමොර දිය යුත්තේ විවිධ ජන වර්ගවලට රිදවීමේ චේතනාවෙන් නොව, වර්ගය, ආගම හෝ ජාතිය යන බැඳීම් බලනොපාන දූෂිතබවත්, අයුක්තියත් පිටුදැකීමේ අරමුණෙනි.

ඉතා ප්‍රකට කියමනක් වන නීතිය මකුළු දැලක් ලෙස තවදුරටත් සැලකුවහොත් ඉතා කුඩා සතුන් එහි දැවටී මියයාමටත්, විශාල සතුන් එය බිඳගෙන රිසි සේ පලායාමටත් හෙටත්-අනිද්දාත් සිදු වනු ඇත.

**දිලුම් යූ. ප්‍රනාන්දු**
එල් එල්.බී. (ගෞරව) (කොළඹ)
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ

# ධනේශ්වරයට විකල්පය බලේශ්වරය ද?



බලය අපයෝජනය වීම
මානව හිමිකම් උල්ලංඝනය වීම
අධිකරණ ක්‍රමයේ නොදියුණුකම
ආර්ථිකය බිඳවැටීම
පරිසර විනාශය
පොලිසියේ දූෂිතබව
ජාවාරම්, අල්ලස, නාස්තිය,
විරැකියාව, අපරාධ, අපිළිවෙළ
ධනපති ක්‍රමයේ
අනිවාර්ය ලක්ෂණයයි
අවිචාරවත් වාමාංශිකයෝ
ආවේගිකව චෝදනා කරති.

වෙස් මුහුණ
මුළුමනින්ම මානව හිතෛෂි වුවද
අමනුස්සකම
ධනවාදයෙහි පමණක් නොව
සමාජවාදයෙහි ද
රහසිගතව සැඟවී පවතින බව
වාමාංශිකයෝ නොදනිති.

අනවධානය කර සඟවන තරමට
අමනුස්සකම
රහසින් වර්ධනය වී බලවත් වේ.
මාක්ස්වාදය බිහිවී
සියවසක් ගෙවී ඇතත්
විද්‍යාත්මක සමාජවාදය
පවතින රටක්
ලෝකයේ කොහෙවත් නැත.

මාක්ස්වාදී ගමන් මාර්ගයෙහි
ගමනාරම්භ කළ රටවල
බිහිවී ඇත්තේ
රාජ්‍ය ධනවාදය සහ
අමානුෂ ආඥාදායකත්වය වේ.

හිරගෙදර හිරකරුවෝ
මන්දපෝෂණයෙන් නොපෙළෙති.
සාගතයෙන් මිය නොයති.
රෝගීව නොමැරෙති.
විරැකියාවෙන් නොපෙළෙති.

ආහාර, සෞඛ්‍යය, ඇඳුම් පැළඳුම්
තාක්ෂණික දැනුම ආදිය
සිරකරුවන්ට නොමිලයේ ලැබේ
පැවරෙන රාජකාරියද
ඔවුන් කළ යුතුය.
ආගමික වතාවත්හි නියැලීමට ද
පහසුකම් ඔවුන්ට සැපයේ.
එහෙත්
ලැබෙන දෙයක් බාරගෙන ඉන්නවා හැර
තමන්ට සිදුවන අසාධාරණයකට එරෙහිව
උද්ඝෝෂණය කරන්නට ඔවුන්ට බැරිය.

උතුරු කොරියාව, චීනය, රුසියාව
වැනි රටවල්
ආර්ථිකව ශක්තිමත් ය.
යුද ශක්තියෙන් බලවත් ය.
එහෙත්
මානව හිමිකම් නැත.
භාෂණයේ නිදහස නැත.
සිවිල් සංවිධාන නැත.
එහෙයිවාදී නොවී
හෘදයසාක්ෂියට කීකරුවන්නෝ
කුරිරු ලෙස ඝාතනය කෙරෙති.
ට්‍රොස්කිලාට පවා
අභයදානය නොලැබේ.
ධනවාදයට විකල්පයක් නැත
එහෙත් මෙහි අමනුස්සකම
පැරදවිය හැකි ය.
සැබෑ අරගලය ඇත්තේ
ධනවාදය සහ සමාජවාදය
අතර නොව
පුරුෂාධිපත්‍යය සහ ස්ත්‍රීවාදය
අතර නොව
ආගම් සහ භෞතිකවාදය
අතර නොව
අමනුස්සකම සහ මනුස්සකම අතරය.

උතුරු යුරෝපීය රටවල්
අමනුස්සකම
උපරිමයෙන් පරදවා ඇත
ඒ.....
ප්‍රජාතන්ත්‍රවාදය,
මානව හිමිකම් සහ
නිදහස් චින්තනය
ඉහළට එසවීමෙනි.
මර්දනය නොකර
ඒ ත්‍රිත්වය පෝෂණය කිරීමෙනි.
මනුෂ්‍යයන් පමණක් නොව
සතා සිව්පාවා සහ ගහකොළ
එහි සහනයෙන් වෙසේ.
වනගහනය වනසමින්
ජනගහනය නොපැතිරේ
වේදනාකාරී වන අයුරින්
සතුන්ව ප්‍රවාහණය සහ ඝාතනය
මුළුමනින්ම තහනම් ය.

අධ්‍යාපනය සහ සෞඛ්‍යය වැනි
මූලික අවශ්‍යතා
සියල්ලන්ට එහි
නොමිලයේ සැපයේ.
මූලික අයිති
සියල්ලන්ටම සමානව හිමිවේ
පාලකයන්ට එහි
අධික බලය හෝ විශේෂ වරප්‍රසාද
අහිමි ය.
සැලසුම් සහගත
නිවැරදි ක්‍රමවේද මාර්ගයෙන්
ජනතා ප්‍රශ්න කඩිනමින් විසඳේ.

**සපුගස්කන්දේ රංජිත්**

# ලැප් - ටොප්



"මහ පෝයට කලියෙන් කුඹුර කපා ගන්ට වෙයි නේද?" තාත්තට කහට කෝප්පය පිළිගන්වමින් අම්මා කියයි. මං මේ කල්පනා කළෙත් ඕකම තමා. මැෂිමෙන් කැපුවොත් වරුවයි. ඊත් ඉතින් කෝ සල්ලි. ඒ කාලෙ වගේ අත්තමට කට්ටිය හොයන්නත් බැහැනෙ. තාත්තා සුසුමක් හෙළන්නේ අතීතය දෑසින් දකින ලෙසමය.

"අපි ඔන්නොහෙ දැකැත්තෙන්ම කපමු" අම්මාගේ වචන කවදත් දිරිමත් ය.

මේ සැරේ නං මට ලැප් ටොප් එකක් ඕනැමයි. ගිය සැරේ ගත්ත නම් අසූදාහකට ගන්න තිබුණා. දැන් ගණන් නැගලා. ලස්ස එකයි විසිපහක් වෙනවලු. ඒක නැතුව මේ දවස්වල මගෙ පාඩම් වැඩත් හරියට කර ගන්න බැරි වුණා.

මා කීවේ නොකියාම බැරි දෙයකි.

"බලමුකො මේ සැරේවත් කුඹුර ගොඩදාගත්තොත් ඕවැන් එකක් ගන්න බැරියැ" තාත්තා කවදත් මගෙ රැකවලාය.

හොඳ අධ්‍යාපනයක් ලබා කවදා හෝ දවසක අපේ රටේ සහල්, එළවළු, පලතුරු පිටරට යවන ව්‍යාපාරයක් පටන් ගැනීම මගේ අරමුණයි. එය ඉෂ්ට කර ගන්නට නවීන තාක්ෂණය අත්‍යවශ්‍යය.

මහවැලියෙන් ලැබුණු ගොඩ ඉඩම් අක්කර බාගෙ හා මඩ ඉඩම් අක්කර දෙකහමාර සොයාගෙන අපේ සීයා හා ඔහුගේ මිතුරු කණ්ඩායමක් සිය ගමරට ඇතැර මෙහි පැමිණ ඇතත් තුන්වන පරම්පරාවේ දරුවන් වන අප මේ දුක්ඛිත ගොවිතැන කෙරේ ආසාව අත හැර ඇත.

කරල් පුපුරන ගිනි අව්වෙන් මිදී අඹගස් සෙවනට ආ සීයාත් සිරිල් මාමාත් අතර කතා බහ මට ඇසේ.

වන ජීවියෙ මහත්තුරු අලි වෙඩි දුන්නට අලි වැටවල් ගැහුවට උන් දැන් ඒවට බය නෑ.

වෙඩි කාගෙන එන්නෙත් බඩගිනි වැඩි කමටනෙ. අර අලි විශාල බඩට වී හැලියක් ඇතෑ, කෙහෙල් ඇවරියක් ඇතෑ. සියදෝරිස් සීය කියන කතාවත් හරිය.

ඒ කාලෙ විජිතපුර හටන කොළේ ගැමුණු කුමාරයා. කෂ්ශප රජ්ජුරුවො මලය එක්ක හටනට ගියෙ ඇතා පිට නැගලා. මේ රජරටේ වැව් දාගැබ් දාහක් හදද්දි අලි ඇත්තු කරට කර වැඩ කොල්ල තියෙනව.

වෙඩි තියල කඳ කුණුවෙන්නත් කලියෙන් දළ කපං ගිහිං විකුණලත් ඉවරයි. ඕව සහගහන අපරාද.

මාම ඔහොම කිව්වට අද උන් කරන විනාසෙ. හේන් කුඹුරු වතුපිටි පාළු කරනව. ගෙවල් කඩනව, මිනිස්සු මරනව. මතකනෙ අර සිරි ආච්චිට කරපු දේ. හිමිදිරියෙ දිවුල් ගෙඩි අහුලද්දි අලිය පෑගුව. මිනිය උස්සද්දි පොඩ්ඩුන් කෑ ගැහැව්ව අත්තම්මා අපට දෙන්ඩයි දිවුල් ඇහින්දෙ කියල.

රෑ තිස්සෙ පැල්රැකල ගෙදර එද්දිනෙ, පියදාස අයියව චප්ප කරල තිබුනෙ. ඒත් පුදුමෙ කියන්නෙ අර සෝමලතා ඉස්කෝලෙ නෝනා මෝටර් සයිකලයෙන් ඉස්කෝලෙ යද්දි පාර දිගේ තුන්පත් රෑනම ඇවිල්ලා. මෙයාට ඔසරි ඇඳන් දුවන්න පුළුවනෑ. ජීවිත ආසාව අතැර ජීවිත කාලෙ පුරා කරපු යහපත් පින් දහම් සිහි කරාන මුණින්තලා වෙලා පොළව බදා ගත්තලු. විනාඩි දහයක් විතර එහෙමම ඉඳල සද්දයක් නැති හංදා ඔලුව උස්සල බලද්දි අර කට්ටිය කැලේ මැද්දටම යන්න ගිහින්. බයිසිකලේ ස්ටාර්ට් එකේම තිබිල.

එදා ඉස්කෝලෙ ගිහින් රතු ඉරට යටින් අස්සන් කළාලු.

මගෙ පංතියේ සුනීත හා ඔහුගේ බාල සහෝදරයන් දෙදෙනාම අද මා පියන් නැති අනාථයෝය. ඔහුගේ මව උදේ මිදුල අතුගාද්දි පිටුපසින් පැමිණි අලියා දැක බියවී නැගූ හඬ ඔස්සේ අලියාගේ හොඬවැල මරුවැලක් වූ හැටි. ඒ මරණයේ තුන් මස් දානයටත් පෙර සුනීතගේ පියා රිය අනතුරකින් මරණයට පත් වූ හැටි මට සිහිවිය.

දුකසේ ඉගෙන ගන්න සුනීත දක්ෂයෙකි. පංතියේ පොහොසත් පවුල්වල ළමයින්ට දුරකතන, ලැප් ටොප් ඇතත් කිසිදාක ඒවාට ඇඟිල්ලක්වත් තබන්නට ඔවුන් අපට ඉඩ නොදේ.

එහෙත් ප්‍රියාල්ගේ දුරකතනය කැඩී තිබියදී එය නැවත සකස් කර දුන්නේ සුනීතය. අලුතින් ටෙලිපෝනයක් හදන්නට ලැප් ටොප් එකක් හදන්නට අපි දෙදෙනාටම හීනයක් ඇතත් අප ලඟ ඇත්තේ තඹ කම්බි කැලි, යකඩ ඇණ වැනි අඩුමකුඩුම කිහිපයක් පමණි.

කඳු උසට රජයෙන් නොමිලයේ දුන් පොත් ගොඩවල් අපේ හිසට මහ බරකි. ඒවායේ පුරවා ඇති දේ අපේ ඔලුවට මහ පීඩනයක් බව කාට කියන්නද? ලැප් ටොප් එකක් මට ලැබුණු දාට සුනීත සමඟ මට එය පාවිච්චි කළ හැක.

බිම වැටී කැඩුනු රේඩියෝවේ ඇතුළ සොයාබලා නැවත් සකස් කළේද මාද සුනීතද එකතුවී ය. කවදා හෝ මගේ අලුත් ව්‍යාපාරයට සුනීතද සම්බන්ධ කර ගත යුතුය.

මං මෙසේ සිතන අතරේ සිරිල් මාමා හා සීයා අතර වාග් සටනද මට ඇසේ.

ඒ කාලෙ සුද්දො විනෝදෙට අලි දෙතුන්දාහකට වෙඩි තියල මැරුවාය කියන්නෙ. උනුත්

උන්නනං වැඩේ බලන්න තිබුණා.

ඒ සිරිල් මාමාගේ කට හඬය.

"පුතෝ.... උඹ ඔහොම කිව්වට අලි ඇත්තු අහිංසකයි. උන්ව කුලප්පු කරන්නෙ අපේ උම්මනෙ. ඕං බලාපන් එහෙනං එහා කැලේ මං දන්න කාලෙ ඉඳල රක්ෂිතේ අක්කර සිය ගාණක් ඇතට කට්ටියක් ඉඩං තන්හාවට කැලේ කප කපා හේන් කෙටුවා. සල්ලි මුදල් යහමින් ඇතිවුන්, කැලේ මැද්දෙ හෝටල් ගැහුව. රට්ටුන්ට අලි පෙන්නල පොටෝ ගහල විකුණනව. උන් සල්ලි කාරයො බල පුළුවන් කාරයො වෙච්චි.

අපේ ගම්වල හිඟන්නො, සාගතේ ඉන්න අලින්ට බතබුලත සපයනව. යන එන ගමන් උන් පාගගෙන යන්නෙත් අර අහිංසකයින්ව මයි.

මුදලට බලයට අද හැමදේම යටවෙලා. මැති ඇමති ගොල්ලත් ආව.

හැතැම්ම දහයක් බයිසිකලේ පාගගෙන ගිහින් මං එතන මිදුල අතුගෑවා. ඒ හිංදයි මං ඕව දන්නෙ".

ඒ සීයාගේ කටහඬයි.

ඉඩම් අක්කර තුනක් හිමි අපේ සීයාට හෝටලයක මිදුල අතුගෑමට සිදු වූයේ ඇයි?....

පීදීගෙන එමින් තිබූ කෙසෙල් කැන් හැලී බිම වැටී ඇත. කෙසෙල් ගස් කඳ කඩා වැටී හඬන්නේ ළදරුවන් මළ මව්වරුන් සේය. කහ පාට ගොබය කඩා දැමූ ලපටි තැඹිලි හා පොල් ගස්වලට කවදා හිස උසවන්නට හැකි වේද?

"පේනව නේද කරල තියෙන වැඩේ" අම්මා හිස අත ගසාගෙන කියයි.

"මං සද්ද නොකර හිටියෙ එළියට බැස්සොත් බෙල්ල පාගයි කියල"

ඒ ගහක් ගලක් සේ සියල්ල ඉවසං දරාගන්නා තාත්තාගේ හඬය. ඔහුගේ වැහැරුනු අත් පා සුදු පැහැ ලෝම සහිත නිතර උස්පහත් වෙන පපු පෙදෙස මා බියට පත් කරයි.

උදේ රැයින් උදැල්ල රැගෙන කුඹුරට යන ඔහු අපට තුන් වේල බත සපයා දීමට අමතරව මගේ ඉගැනීමට දරන වැය අපමණය.

"යලේ කුඹුරත් ඕකුං පෑගුව. මෙදා සැරෙත් ඒ සංතෑසියම උනොත් තමා වැඩේ". අම්ම දැන් පිට කොන්දේ ගසා ගෙන සුසුම් ලයි.

ඊයෙ රෑ දෙගොඩ හරි ජාමයේ ඇතින් ඇසුනු කෑ කෝ ගැසීම්... රතිඤ්ඤා වෙඩි හඬ සේම බල්ලන්ගේ උඩුබුරා ලෑම් අනතුරක මහා විනාශයක පෙර ලකුණු සේ සිහියට නැගේ. අලි රංචුව මිදුලට එද්දීත් අප සිටියේ දොරගුලු දමාගෙනය.

මීදුමට හසුවූ ලෙස මගේ දෑස් බොඳවී යද්දී අම්මාත්, තාත්තාත් කුඹුර පැත්තට දුව යනු මම ගල් ගැසී බලා සිටියෙමි.

මැටිල්ඩා අධිකාරම්
තලාව

# ඕං එහෙනං



නැගම් යන්නට මළගම් යන්නට මඟුල් තුලාවක් කරන්න බෑ
කෙරුවත් මඟුලක් සුව උපදෙස් මත අලුතින් දරුවෙක් හදන්න බෑ
අවුරුදු කෑවා කොරෝනා නෑවා මිනිස්සු මැරෙනවා දරන්න බෑ
චීන, ඉන්දු, රුසියා, ඇමරිකා එන්නත් කරනවා මැරෙන්න බෑ

හරිම සැපයි දැන් කොරෝනා අස්සේ ගාරනා යනවා ජොලිද බොලං
"හැට නම ලක්ෂෙ" වියරුව ගහලා ඔලුගෙඩි ඉදිමිලා නටනු බලං
වේල් තුනම කා තෙල් මදු මෝරා රට වැස්සෝ ලෙඩ්ඩු බොලං
දෙවේල කාලා තෙල් හිඳ ගන්නට මන්තිරු හදනවා බලං බොලං

පොහොර ඉල්ලලා ගොවියෝ අඬන කොට ගුරුවරු පාරට බහිනු බලං
කොරෝනා සටනේ පෙරමුණ ගන්නා සුව සේවක දුක අහල බලං
කැලෑ කපන හැටි රට විකුණන හැටි රටට හිතැති උන් කියනු බලං
පොලිසිය ඇවිදින් උන් කුදලා ගෙන සැපදුක් විමසන අයුරු බලං

කොරෝනා මඬින්න දා ගත් නීතිය අඳුරේ අතපත ගානු බලං
කසිප්පු බීලා මිනිස්සු මැරෙනා දුක දරන්න බැරි මැතිඳුන් දිහා බලං
කඩපිල වහලා බාර්ටික ඇරලා පොකුරක් හැදුණත් අහක බලං
ඉන්නා ලොක්කන් ඉන්නවා අපිටත් ඒකත් අපි පිට දාලා බොලං

නැව් පෙරලෙනවා මාළු මැරෙනවා සයුරේ වස විෂ තිබෙනු බොලං
වාරකනෙටලු මාළු මැරෙන්නේ වියත් මගින් ඒ ගැන අහලා බලං
දියවන්නාවේ උන් වේලක් කන හැටි ඇස් ගෙඩි ඇරලා හොඳට බලං
බඩේ හුලං බොල රටේම මිනිසුන් දත්මිටි කන හැටි බලං බොලං

කුඩු වෙඩි කාරයෝ නිදහස් වන්නා මැදියම් රෑ ගිවිසුමේ හොඳට බලං
බේබදු ඇමතියෙක් තුවක්කු අරගෙන ජව්සන් නටනවා හිරේ බලං
බලයට ධනයට ඇතිවන වියරුව විස්ස පෙරළලා කියලා බලං
කකුළුවෝ නටන්නේ වතුර නටන කං පමණයි කියලා හොඳට බලං

**ජෝසප් ඩයස්**

# "WHERE THERE ARE GREAT RICHES, THERE ARE ALSO MANY TO DEVOUR THEM" (ECCLESIASTES 5,10)

**1. Introduction:**

The sensitive appetite leads us to desire pleasant things we do not have. These desires are good in themselves.

Nevertheless, our desires may often exceed the limits of reason and drive us to covet unjustly what is not ours and belongs to another or is owned to him. This common experience is stated by the sages of Israel in Ecclesiastes: "Where there are great riches, there are also many to devour them." In other words, he who loves money never has money enough. Hence it is appropriate that we treat the theme of avarice from a biblico-theological perspective.

**2. Avarice according to CCC:**

The Catechism of the Catholic Church (CCC), the symphony of the Catholic Faith, states the following as regards avarice:

i. Avarice is a capital sin.

Sin creates a proclivity to sin. The repetition of sins engenders vices, among which are the capital sins. Avarice is classified as one of them (CCC 1866).

ii. The Tenth Commandment forbids avarice.

The Tenth Commandment forbids coveting the goods of another, avarice, greed and desire to amass earthly goods without limit (CCC 2534).

iii. Avarice originates in idolatry (CCC 2534); it arises from a passion for riches and their attendant power (CCC 2536).

**3. Avarice-Betrayal Nexus:**

After winding our way through the compendium of the Catholic Faith, we reach the oasis of the sacred Page. One of the excruciating questions the early Christians were grappling with was Jesus' betrayal by Judas. Jesus was betrayed not

by an outsider but by one of His disciples, "one of the Twelve", whom He summoned and commissioned. How was it possible? That was the sad and shy memory, which haunted and tantalized the early followers of Jesus.

As we go through the Gospels, we find how the Evangelists address this issue in variant ways. The early Gospels of Mark and Matthew present the reason for betrayal as 'avarice': "Then Judas Iscariot, one of the Twelve, went off to the chief priests to hand him over to them. When they heard him they were pleased and promised to pay him silver. Then he looked for an opportunity to hand him over" (Mark 14,10-11); "Then one of the Twelve, who was called Judas Iscariot, went to the chief priests and said, "What are you willing to give me if I hand him over to you?" They paid him thirty pieces of silver, and from that time on he looked for an opportunity to hand him over" (Matthew 26,14-16). Avarice as the motive behind the great betrayal is 'implicit' in Mark, whilst 'explicit' in Matthew.

What would happen to the ill-gotten money of Judas? Would avarice reward his life? What happened on the first Easter Sunday is now part of our sacred history – i.e. God raised Jesus from the dead, having vanquished the power of evil. In the words of St. Peter, "Therefore let the whole house of Israel know for certain that God has made him both Lord and Messiah, this Jesus whom you crucified" (Acts 2,36). Hence "Christus vincit! Christus regnat! Christus imperat!" – 'Christ conquers, Christ reigns, Christ commands.'

What became then the fate of Judas, the slave of avarice? Concerning the death of Judas, there are clearly two traditions. In Matthew, Judas commits suicide: "and going away, he hanged himself" (27,5). In Acts, Judas purchases a piece of property with the betrayal money and is killed on it in a fall: "He bought a parcel of land with the wages of his iniquity, and falling headlong, he burst open in the middle, and all his insides spilled out" (1,18). No matter how he died, avarice did not better off his life but drove it to a bitter end.

**4. "For where your treasure is, there also will your heart be"**

From Judas we now move on to the Saint of the poor. In the days of St. Anthony, Padua was a different city – an abode of luxury as well as a haunt of vice. Two social problems loomed large therein. The first was the oppression of the serfs by their feudal lords and the second was the practice of usury. Thus God seemed forgotten in people's patterns of behaviour.

Let us focus on usury. In the days of St. Anthony, usury was widespread. The rates of interest collected by the money-lenders were unbelievably exorbitant. The interest generally levied ranged from 20 % to 30 %, while some usurers were so fiendishly heartless as to demand 60% to 70% when they saw that their victims were helpless. In 1228, the Commune of Padua established for the benefit of the students of the University, a bank which lent money at the rate of 20%.

The money-lenders treated their debtors with the utmost brutality. Insolvent debtors were stripped of all their property and even of their liberty. They were condemned to banishment for life, or cast into foul prisons where they languished till they died. Thus the days of the Saint were marred by the vice of avarice.

St. Anthony carried on, in this obnoxious context, a relentless fight against these rapacious vultures. In later years, the Franciscan Friars opened popular banks called the Monti di Pieta to save the people from the clutches of the usurers. By St. Anthony's soul stirring and heart throbbing exhortations, many usurers were converted and many of them sold their lands and houses to procure money for restitution.

A classic miracle, worked out by the Saint, is on record. One day a notorious usurer in the city died. Anthony was invited to preach. He preached a topical sermon on usury. He based on the words of the Lord in Matthew 6,21: ubi enim est thesaurus tuus ibi est et cor tuum ('For where your treasure is, there also will your heart be'). He declared, "Since this deed was infatuated with love of gold and silver instead of the love of God, his heart should be found not in his breast, but in his cash-box." People opened up the dead man's safe and found his heart on top of the gold he had hoarded.

Directly through St. Anthony's efforts, on March 15, 1231, there was enacted the first Bankruptcy Law in Padua, which explicitly forbade the imprisonment of debtors. It is expressly stated in the text of the Law, an authentic copy of which is preserved in the Municipal Library of Padua, that this measure was enacted "at the request of Brother Anthony of the Friars Minor."

This was how St. Anthony of Padua redeemed the society of his day, blemished with avarice. Thus none can say, 'No way out', for there is always a way out and a way forward. Avarice languishes at the dawn of generosity. The Crucified Christ is the example par excellence!

**Rev. Fr. Don Anton Saman Hettiarach-chi**
St. Anthony's Church

# මේ අහන්න

වෛරයේ වයිරසය ලොව පුරා දුව ගියා
මරණයේ පණිවුඩය කනට කර කිය කියා
උස් පුටුව, මිටි පුටුව ගැන බැලුවෙ නැහැ එයා
දඬුවමක රඟ මිනිස් වග වෙතට දී ලියා

කට වසාගෙන ඉන්න - දෑස් හඳුනා ගන්න
බොරුව හා අයුතුකම් නොකර දැහැමිව ඉන්න
නපුරු ගති ඉවතලා කාහටත් සලකන්න
බැරි ඇයිද කියා මට මිනිසුනේ පවසන්න

මාරුතය හැමූ දා වැටුණි මහ ගස් බිඳී
අක්මුල්ද මතුවුණා පොළෝ තලයෙන් මිදී
රැස් කළත් බොහෝ දේ පස් පවෙන් බැඳී
හිස් වෙලා අවසනේ හුස්ම හිරවී නිඳී

බදා ගෙන සිටිනු ඇයි බෙදා ගමු හොඳ හිතින්
පුදා සෙනෙහස අසල්වැසියනට පෙම් කරන්
මුදා බර පොදි සැහැල්ලුව ඉන්න වෙර දරන්
සදාකාලික නොවූ ජීවිතය ගැන හිතන්

කරේ අත දමා ගෙන සිටිය මුත් නැහැ ගුණේ
දුරින් හිඳ බිය සැකෙන් බලනු ඇයි මිතුරනේ
මරණයද, මඟුල ගැන සාද මොකටද අනේ
අපූරුයි... අපූරුයි... ඉගන ගන් මිනිසුනේ

යන්න බැහැ මට තවම මේ ලොවින් පිටවෙලා
ඉන්න හිතෙනා අයට මේ රහස කොඳුරලා
ගන්න තුරු පණිවුඩේ උන් මගෙන් උදුරලා
ඉන්නෙ මං, යන්නෙ නෑ මේ ලොවින් පිටවෙලා

**සඳමාලි ජයසිංහ**
තඹුත්තේගම

# ඔබ කැත ද?

ඔයාගේ පියයුරු කුඩා නම් හෝ විශාල නම් ඔබට කියයි ඔබ කැතයි කියා.

ඔයාගේ පසු ප්‍රදේශය ඉතා කුඩා නම් හෝ විශාල නම් ඔබට කියයි ඔබ කැතයි කියා.

ඔබගේ නහය ,මුහුණ, කන, එල්ලා වැටෙන බඩ ප්‍රදේශ හා  අනිකුත් සිරුරු කොටස්වල වෙනස්කම් නිසා ඔබටත් ඔබගේ ලස්සන ගැන තක්සේරු කර ඇත්ද? ඔබ කැතද? ඔබ කොටද? ඔබේ මස්පිඩු නැතිද?

ඉතින් ප්ලාස්ටික් ශල්‍ය වෛද්‍යවරයකු ලෙස වසර දහයකට ආසන්න සේවය තුළ මින් එහාට දේවලුත් මිනිසුන් අපෙන් අසා ඇත.

"Can I have my purity back? I Lost my virginity due small accidental incident" ඒ ඉංග්‍රීසි හුරුවට වූ කාන්තාවගේ ප්‍රශ්නයකි.

මගේ පිළිතුර වූයේ, "I don't know about your purity: but I can guide you to have your hymen back" ඉස්සර සිංගප්පූරුවේ ලංකාවේ උසස් යැයි සම්මත කාන්තාවන් කසාදෙට පෙර වන වැරදි පෙර සවි කිරීමට කර ශල්‍යකර්මය දැන් ලංකාවේ ද වෙයි.

මේවා ප්ලාස්ටික් හා නැවත පිළිසැකසුම් කිරීමේ ජ්‍යෙෂ්ඨ ශල්‍ය වෛද්‍යවරයකු ලෙස මගේ විෂය පථය 5% ක් පමණි. අප රෝහලේ විශේෂයෙන් කරනුයේ ලංකාවේ වන හදිසි අනතුරු හා පිළිස්සුම් නැවත පිළිසැකසීමයි. ලංකාවේ ජාතික ශිල්පය විදියට කඩු සටන්, අඬදබර නැවත ඉහළ ගියේ පසුගිය සැප්තැම්බර් 17 වනදා මත් වතුර කඩ නැවත නිල වශයෙන් විවෘත කළ දිනදී ය. ඒ අමද්‍යප ව්‍යාපාරය ඉතා ඉහළ ලෙස සැලකූ අනාගාරික ධර්මපාල උතුමාණන්ගේ ජන්ම උත්සවය දිනය දා වේ.

ඉතින් අප සමාජයේ මේ ලස්සණ කර ගැනීමේ රූපලාවණ්‍යාගාරයන්ගෙන් නොනැවතී, අධික වියදම් සහිත ප්ලාස්ටික් සැත්කම් දක්වා කරන තත්ත්වයට පත්ව ඇත. මේ ඔක්තෝබර් මාසය වේ. දේව මාතා කැපකර ඇති මාසය වේ. මාගේ විශ්වාසය ඉහළම කාන්තාව මරියතුමියයි. එතුමියගේ ලස්සන අප හැබෑවටම දැක නැත. නමුත් එතුමියගේ ගුණ කඳ ඉතා ඉහළය, දරා දරාගැනීම ඉතා විශිෂ්ට ය. මරි මව් ගුණය විග්‍රහ කරන්නට මා දන්නා වචන ප්‍රමාණවත් නැත.

අද කාන්තාව ඇත්තටම කැතද?  ඇයි අප ලස්සණ වන්නේ? අප විග්‍රහ කළ යුත්තේ ඇයි? මේ හැමදේම සාපේක්ෂ ය. ලස්සණ, පිරිසිදුකම අපට උරුම කොටසකි. එය ආරක්ෂා කිරීම හැර  වැඩි යමක් කිරීමට ඔබට සිදුවූවොත් එයට ගෙවීමක් ද, කළ යුතුය. එය මුදල්, කාලය හෝ සමහර විට ජීවිතය ද විය හැකිය. සියලු සැත්කම් අවසානයේ සැත්කමට ඉදිරිපත් වූ බොහෝ දෙනා නැගිට්ටත් සමහරු ජීවිත ගමන අවසාන කරති. එය සුළු වූවත්, මැරුණොත් ඔබ නැතිය. ඉතින් ඔබ ඔබේ ලැබීම අගයන්න. තමාගේ රූපය හෝ තමා ව ඇති සැටියෙන් බාරගන්න. ඔබට අකමැති, ඔබේ සිරුරේ හැඩයට අකමැති අය සතුටු කිරීම අපරාධයක් යැයි මට හැගේ. නෑම, කොණ්ඩා පීරුම හා කැපීම හා පිළිවෙළකට පිරිසුදු චාම් ඇඳුමක් ඇඳීම සෑහෙන බව මගේ පණිවුඩයයි. ඉතින් අප පරිණත දේව ත්‍යාගයක් ලැබූ මිනිසුන් බව අමතක නොකළ යුතු ය. දේව මාතාව වූ මරියෝත්තමාවන්ගේ ජීවිතය පරමාදර්ශයක් කරගෙන අපගේ ජීවිත එතුමියගේ ජීවිත සුලක්ෂණ තුළින් ගොඩනගා ගැනීම එතුමියට කරන්නාවූ මහත් ගෞරවයකි.


**වෛද්‍ය සචිත මිලින්ද මෙන්ඩිස්**
ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී උ.කො.
ශික්ෂණ රෝහල
රාගම

## ආරෝග්‍යා පරමා ලාභා

"යමක් සිදුකොට පසුතැවෙන්නට සිදුවේ ද,
යමක විපාක කඳුළු සලන මුහුණින් යුතුව හඬමින් විඳින්නට සිදුවේ ද,
එවැනි දෙයක් සිදු නොකොට සිටීම යහපත් ය.
ඒ නිසා තමාගේ නිරෝගිකම නැතිවන අයුරින් කටයුතු කරන්නෝ
පසුව පසු තැවෙන්නෝ නොවෙත්වා."

-උපුටාගැනීමකි-

## අම්මගේ හද ගැස්ම.....



# වැව් තාවුල්ල



සැතපුම් සියක් ගණනක් දුර විහිද ගිය
විවර්ණ තුරු සිරස් පැතිරිලා දසත
අලි ඇතුන් වලසුන් නෙක ගහන,
තෙත්, වියළි බවින් පිරුන මන බඳින,
ඇලක්, ඔයක්, දිය පාරක්
ගලයි දසත සිසිල අරන්,
හැම තැන පිරි දිය උල්පත්
වතුරෙන් නැත කිසි අඩුවක්
හදවතමයි ගතින් සිතින්
රජුන් තනයි දෙරණ මතින්
අභිමානවත් මේ සුන්දර භූමි
වැව් තාවුල්ල...
එක් පසකින් සීමා බිඳ හෙළන
කපොලු, නිම්න මතින් රජ ගමන යන,
වැව් කොමලි රමණීය
පරක් තෙරක් නොපෙනෙන වන රජ දහන
කියා නිම කරන්නට බැරි සම්පත් දරන
සුන්දර දසුන් මවමින් නිහඬව ගලන දියවර
සොඳුරුයි රටට පමණක් නොව
ලෝකෙට ම

රුවිනි කාවින්දයා
නිවන්දම

## ජපමාල මාසය

| | |
|---|---|
| නමෝමරිය පණස්තුනකින් වට | කෙරුව |
| ස්වර්ගීය පියාණන් වෙත යොමු | කෙරුව |
| සුද්දවූ ත්‍රිත්වය වෙත හද පුද | කෙරුව |
| කතෝලිකයො ජපමාලෙට අත | හුරුව |
| | |
| නැතිවම බැරිදෙයකි යැදුමට | ජපමාලේ |
| පිළිසිඳ ගැනීමත් මරණෙත් ජේසුගෙ | බාලේ |
| දෙව් මව් වින්ද දුක දොම්නස ඒ | කාලේ |
| ගැබ් වී තිබෙන කැඩපත අද | ජපමාලේ |
| | |
| මනුලොව සිට සුරලොව ඇමතිය | හැකිය |
| යන එන හැම තැනම අත ගෙන යා | හැකිය |
| තනි නොතනියට ජේසු දෙව් මව් වෙත | බැතිය |
| අත ඇති  සවිය ජපමාලය ජය | කොඩිය |
| | |
| දවසට වරක් ජපමාලය ගෙන | අතට |
| දෙව් මව් ජේසු සුදතුම් සමගින් | එකට |
| අවසන් ගමන යනවිට දෙවිඳුන් | වෙතට |
| ජපමාලයයි දෙන්නේ ගෙන යන්නට | අතට |



බෙනඩික්ට් විජේසිංහ
කඩවත

## චුට්ටා

**කලාපයෙන් කලාපයට භක්තියෙන් ප්‍රබෝධනයට ලියන**

**චූටිකමට කියන කතා....**

(බ)ලය යනු බලවත් ලය බව කියති. එසේම (ධ)නය සියලු ණය ගෙවිය හැකි මුදල බව කියති. ධනය ඇත්නම් බලය ඇත. බලය ඇත්නම් ධනය ඇත. ධනය වැඩිපුර ඇත්තාට (මු)දල ඇත. ඉතින් ඒ දලෙන් අනිත් අයට අනිති. මරති. ඇනල මරල වුණත් බේරෙති. (මු)දල සාදා ගැනීමට මිනිසුන් බොහෝ වෙර දරති. සමහරුන්ට ක්ෂණිකව (මු)දල ලැබෙති. ඒ දල හුඟක් විෂය. විසකුරුය. ඒ නිසා ඒ දල කාරයන්ට කවුරුත් බය ය. සමහරු හොර මැර වංචා කරමින් (මු)දල හදා ගනිති. ඒ අනුව (මු)දල ඇති සතා (බ)ලය මත තබා (ධ)නය නොගෙවාම නීතියේ දැලෙන් රිංගා ගනිති. (මු)දල දකින උසස් නිලධාරීන් පවා කොන්ද නවන්නේ දැඩි ගෞරවයටය. ඒ නිසා හාල් මැස්සකුට රිංගා යා නොහැකි දැලෙන් තෝරු මෝරු තල්මසුන්ට පවා කිසිදු උපද්‍රවයක් නැතිව රිංගා යාමට දෑස් පියා ගන්නේ නිදිමත නිසා නොවේය. හොරු අල්ලනව බලන් ඉඳල දෑස් රිදෙන නිසා විය හැකිය.

මේ නිසා අද රටේ බොහෝ තැන්වල (නි)ලය, (බ)ලය, (කා)ලයට අනුව (මු)දල වවා ගන්න ක්‍රම සහ විධිවලින් "තරු" ලබා සිටින ආරක්ෂක අංශවලට පවා නිදි බෙහෙත් ලබා දී ඇත. ලොකු (මු)දල හමුවේ කකුල් වෙව්ලන නිලධාරීන්ට විටමින් ගත්තට ඇඟට අල්ලන්නේ නැත. මන්ද ජරාවම කා පුරුදු අයට පෝෂණදායක කෑම නොගැලපෙන නිසාය. ඒකනෙ කියන්නෙ ඌරන්ට මොන සෞඛ්‍යයද කියල නේද? අපේ රටටත් (ධ)නය වැඩි වෙලා අපි හැම රටකටම යටත් වී ඇත. (බ)ලය පොඩි කරගෙන අපට හුස්ම ගන්නවත් ඉඩක් නැත. තව නොබෝ දිනකින් අපිටත් ඉන්දියන් සාගරයට පනින්න වේවි. ඒ කියන්නෙ අපිට කියා දැන් සාගරයක්වත් නැත. ඒකත් දැන් ඉන්දියන් ය. අපේ රට නම් සංඛ්‍යා ලේඛනවලින් හුඟක් සංවර්ධනය වී ඇති රටකි. ආර්ථිකය, සෞඛ්‍යය හා අධ්‍යාපනය ඇතුළු සෑම අංශයක්ම බොහෝ රටවල් අබිබවා දියුණු වී ඇත. ඒ නිසා අපි අරුම පුදුම ලන්තයක් වී හමාරය. පැරණි කාලේ අපේ රටට කීවේ ඉන්දියන් සාගරයෙ මුතු ඇටය කියා ය. ඒත් දැන් නම් (අ)මුතු ඇටයක් වී ඇත. අනේ මන්දා....?

**ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ. තු. නි. පියතුමා**

"සියලුම සත්ත්වයන් අතරින් උසස්ම බුද්ධිමත්ම සත්ත්වයා වන මිනිසා තමන්ව පාලනය කර ගැනීම සඳහා කිසිදු හැකියාවක් නැති දක්ෂතාවක් නැති කපටින් පිරිසක් තමන්ගේ පාලකයන් වශයෙන් තෝරා පත්කර ගන්නේ මන්ද?"

- ප්ලේටෝ -

# සමුගත් අදරැති මල්ලී ක්ලෝඩ් (2021.06.19)



පසුගිය ජුනි දහනවයේ මද්දහනේ
ඈතට ගියා ඔබ ආපසු නොඑන ලෙසේ
පෙර ලකුණක්වත් ඇයි අපහට නොමදුන්නේ
දැනෙයි වේදනා හැමවිට හද පතුලේ

ලේ වැල්ලේ පාතිමා ජේසු ආරාමේ
සිට මට පෙනෙයි මහවැලි ගඟ ගලන රගේ
ඉම කොන නැතිව ගලනා ඒ දිය වාගේ
නොපෙනේ නතර වන තැනකුදු මේ ශෝකේ

හිටි හැටි ගමන් ඔබෙ වියෝව ඇසුණ විට
කඩා වැටුණි අප දෙනෙතේ කඳුළු කැට
සිතුවද කෙලෙස හදා ගන්න බැරිය සිත
දෙවිඳුට මිසක අන් කවරෙකු කරනු කිම

මොනයම් වැඩකදී වුව ඔබ පෙරමුණෙය
වැඩි කථා නැති වුණත් ඔබ නිති වැඩවලය
ඔබෙ රුව මට පෙනෙයි සිහිනෙන් හැමදාම
සිනා මුසු මුහුණ සමඟින් නිති පෙරසේම

සිහිකර සැනසෙන්නෙමු ඔබෙ ගුණ වරුණ
සුරලොව සිට අප හා නිති එක්වන්න
දෙවිඳුන් ඉදිරියේ අප සිහි කරවන්න
ආදර මල්ලි හමුවෙමු සගපුර තුටින

**එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා**